## ලංසු සඳහා ආරාධනයයි

# ජාතික ආරක්ෂක විද්‍යායතනය

**544, ගාලු පාර, කොළඹ 03**

## කුලී ගෙවීමේ පදනම මත ගොඩනැගිලි ලබා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

**අවම වශයෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 50 ක් සඳහා නවාතැන් පහසුකම් සැපයිය හැකි තට්ටු නිවාස පහත සඳහන් පහසුකම් වලින් සමන්විත විය යුතු අතර කාලය අවුරුදු 01 වන අතර නැවත දීර්ඝ කිරීමේ පදනම මත අවුරුදු 03 කි.**

**කොන්ත්‍රාත් අංකයඃ NDC/PROC/BOARD/49/2023**

ආරක්ෂක අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු සභාපතිවරයා විසින් ඉහත දක්වා ඇති කටයුතු සඳහා ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

- ජාතික ආරක්ෂක විද්‍යායතනයේ සිට කිලෝ මීටර් 10ක් ඇතුලත පිහිටා තිබිය යුතුය.
- අවම වශයෙන් කාමර 02 ක් සහිත "තට්ටු නිවාස" (Apartment) වර්ගයේ නිවාස අවම වශයෙන් 18-24 හෝ කාමර (Rooms) අවම වශයෙන් 25 ක ගොඩනැගිල්ලක් විය යුතුය.
- එක් නිවාසයක් වර්ග අඩි 800-1250 අතර ප්‍රමාණයකින් යුක්ත විය යුතු අතර, නාන කාමර අවම වශයෙන් 02 ක් තිබිය යුතුය.
- මුළුතැන්ගෙයක් සහ කෑම කාමරයක් සහිත විය යුතුය.
- සියලු කාමර වායුසමනයකර/විදුලි පංකා වලින් සමන්විත විය යුතුය.
- ආරක්ෂිත වැට/තාප්පයකින් සමන්විත වීම.
- සියලුම නිවෙස් සඳහා වෙන වෙනම විදුලි හා ජල මීටර් තිබිය යුතුය.
- විදුලි විසන්ධි වීමකදී සම්පූර්ණ ගොඩනැගිල්ලේම විදුලිය සැපයීම සඳහා විදුලි ජනක යන්ත්‍රයකින් සමන්විත වීම.
- ගොඩනැගිල්ල අංග සම්පූර්ණ ලෙස නිමකර තිබිය යුතුය.
- සැහැල්ලු වාහන 15-20 ක් ගාල් කර තැබීමට හැකි භූමියකින් සමන්විත වීම.
- ඉහත නේවාසික පහසුකම් ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රියදුරන් හට නවාතැන් ලබා ගැනීමට (Driver Accommodation) පහසු වන පරිදි (විදුලි පංකා, පොදු නානකාමර, වැසිකිලි පහසුකම් සහිත) ඉඩ ප්‍රමාණයක් (සුදුසු පරිදි) එම ගොඩනැගිල්ලෙහි සමන්විත විය යුතුය.
- ජලය රැස්කර තබාගැනීම සඳහා ප්‍රමාණවත් ජල ටැංකියකින් සමන්විත වීම.
- නේවාසික කාමර පහත සඳහන් ලී බඩු හා උපකරණ වලින් සමන්විත වීම.
- ලංසු ලේඛන නිකුත්කිරීමේදී ආපසු නොගෙවනු ලබන (Non Refundable Deposit) **රු.20,000.00** ක මුදල ආරක්ෂක අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත ගෙවිය යුතු අතර, එම කුවිත්තාසිය (Receipt) මිල ගණන් කැඳවීමේදී ලංසු ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.
- ලංසු සුරක්ෂණය (Bid Security) වාණිජ බැංකුවකින් ලබා ගත යුතු අතර එහි වටිනාකම **රු.1,080,000.00** කි. **(2023.12.28** දින සිට **2024.03.27** දක්වා විය යුතුය)
- වැඩි විස්තර සඳහා විමසීම්: ලුතිනන් කර්නල් ඒඑම්ආර්එච්බී අබේසිංහ යූඑස්පී - **077 071 7559 / 011 232 7061**

එක් නිවසක් සඳහා තිබිය යුතු භාණ්ඩ

| අනු අංකය | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | Refrigerator | 01 |
| 2 | Washing Machine | 01 |
| 3 | Living Room Furniture | 01 |
| 4 | TV 32" | 01 |
| 5 | Dining table | 01 |
| 6 | Dining chairs | 04 |
| 7 | Microwave Oven | 01 |
| 8 | Gas Cooker | 01 |
| 9 | Cutlery for dinning and preparing tea (for four individuals) | |

| අනු අංකය | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 10 | Bed Double with mattress | 01 |
| 11 | Almirah | 01 |
| 12 | Writing table | 01 |
| 13 | Writing chairs | 01 |
| 14 | Bed side Cupboard | 01 |
| 15 | Book rack | 01 |

ලංසු ලේඛනයන් **දෙවන මහළ, ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලය, ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ** යන ස්ථානයෙන් **2023.12.07** වන දින සිට **2023.12.27** වන දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා ලබාගත හැකි අතර, රැගෙනයාමට පැමිණෙන දිනට පෙර ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලයෙන් පැමිණෙන පුද්ගලයින්ගේ තොරතුරු සඳහන් කර දොරටු අවසරය ලබාගත යුතුය. දුරකථනඃ **011-2390719**, ෆැක්ස් **011-2390720** සහ විද්‍යුත් ලිපිනය **procurement@defence.lk**

**මුල්පිටපත් සහ අනුපිටපත්** ලෙස සඳහන් සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන වෙන වෙනම කවරවල බහා එම කවර, වම්පස ඉහළ කෙලවරේ **"ජාතික ආරක්ෂක විද්‍යායතනය වෙත ගොඩනැගිලි බදු දීම"** ලෙස සටහන් කර මුද්‍රා තබන ලද තනි කවරයක දමා **2023.12.28** වන දින **පෙ.ව. 10.00** පැයට හෝ ඊට ප්‍රථම ඉහත ලිපිනයේ ටෙන්ඩර් පෙට්ටිය තුළට බහාලීමට කටයුතු කරන්න. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු භාරගැනීම **2023.12.28** වන දින **පෙ.ව. 10.00** ට අවසන් වන අතර, ලංසු විවෘත කිරීම එම මොහොතේ සිදු කරනු ලැබේ. ඒ සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගිවිය හැකිය.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය**
**ශ්‍රී ජයවර්ධනපුර,කෝට්ටේ.**

SELACINE